// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2219/69 - 2021 මාර්තු මස 19 වැනි සිකුරාදා - 2021.03.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය* : BOP/4/4/1-78.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/11/2018/H/480.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (I) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:*

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ බෝපේ පෝද්දල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 126, ගොඩකන්ද ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ගොඩකන්ද ගමේ පිහිටි මූලික පිඹුරු අංක ගා/4524 දරන මූලික පිඹුරේ කැබලි අංක 01 ලෙස නිරූපිත පහත විස්තර කෙරෙන ඉඩම් කොටස.

01. **කැබලි අංකය 01**

ඉඩමේ නම: කරාපිටිය වත්ත *නොහොත්* ඕබැද්දගේ වත්ත; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: දිලූෂා දුමින්දි බෝපෙ වීරතුංග, අංක 274, මිල්කෝ පාර, දිගන, රජවැල්ල, මහනුවර; ප්‍රමාණය: හෙක්ටයාර් 0.1418.

ඉහත සඳහන් ඉඩම් කැබැල්ලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සබඳකම් කියා සිටින සියලු දෙනාම තමතමන් හෝ ඔවුනගේ ලියවිලිවලින් බලයලත් අයවළුන් 2021.03.31 වැනි දින පූ.භා. 10.00 ට බොපේ පෝද්දල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී, මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2021.03.23 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන්, එකී ඉඩම් ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. අයිතිය තහවුරු කිරීම සඳහා ඔබ වෙත ඇති සියලුම ඔප්පු හා ලියවිලි ද, ඊට අදාළ පත්ඉරු පිටපත් ද, පරීක්ෂණ අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතුය.

ප්‍රභාෂි සී. විදානපතිරණ,
ප්‍රාදේශීය ලේකම්, (රා.ආ)
බෝපෙ - පෝද්දල.

2021 පෙබරවාරි මස 17 වැනි දින,
බෝපේ - පෝද්දල, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

04 - 98

ශුද්ධිපත්‍රයයි

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : MTR/LND/L1/ACQUI/3957.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1222/20 හා 2002.08.08 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* මාතර ප්‍රාදේශීය ලේකම් විසින් පළකරන ලද ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ දැන්වීමෙහි සඳහන් සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණිය යුතු දිනයන් පහත පරිදි සංශෝධනය විය යුතු බව මෙයින් දැනුම් දෙමි.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තමතමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2021 අප්‍රේල් මස 21 වැනි දින පෙ.ව. 10.00 ට මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2021 අප්‍රේල් මස 08 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරයත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ප්‍රාදේශීය ලේකම්,
මාතර - කඩවත් සතර.

2021 මාර්තු මස 10 වැනි දින.

04 - 99

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.